# 07

# ධම්ම පදයෙන් බිඳක්

මෙලොව පරලොව දියුණුව මෙන් ම නිවන් අරමුණ ද සපුරා ගැනීම සඳහා සදුපදේශ සපයන ධම්ම පදය, බෞද්ධ දර්ශනයේ එන ගැඹුරු ධර්ම කරුණු සරල උපමා භාවිතයෙන් විස්තර කරන වටිනා ධර්ම ග්‍රන්ථයකි. එහි දී උගත් නූගත් ලොකු කුඩා සියලු දෙනාට ගෝචර වන අන්දමට එදිනෙදා ජීවිතයේ නෙත ගැටෙන සංසිද්ධි ද පාදක කොට ගෙන කරුණු විස්තර කරන අයුරු අපූරු ය. ගාථා 423 ක් ද වග්ග හෙවත් පරිච්ඡේද 26ක් ද ධම්ම පදයෙහි දක්නට ලැබේ. සූත්‍ර පිටකයේ පස්වන කොටස වන බුද්දක නිකායට අයත් ග්‍රන්ථ 15න් එකක් වන ධම්ම පදය අගනා දහම් කරුණු පාලි පද්‍ය අනුසාරයෙන් ඉදිරිපත් කිරීම විශේෂත්වයක් වේ.

## සුකරානි අසාධූනි

යහපත් දෙයක් කළ හැක්කේ යහපත් සිතිවිලි ඇති අයකුට ම ය. එම ක්‍රියාවෙන් ඔහුගේ යහපත් බව තව තවත් දියුණු වේ. එසේ වුවත් එය එතරම් පහසු කාර්යයක් නොවේ. උඩු ගං බලා පිහිනීමක් වැනි දුෂ්කර කාර්යයකි. එමෙන් ම තමාට අයහපත පිණිස පවතින දේ සිදු කිරීම පහසු ය. ජලය පහළට ම ගලා යන්නාක් මෙනි. මේ බව පැහැදිලි කෙරෙන ගාථාවක් ධම්ම පදයේ ඇතුළත් වේ. එම ගාථා දේශනාවට පසුබිම් වූ කථා පුවතක් ද ඇත.

රජගහ නුවර බිම්බිසාර මහරජතුමා විසින් පුදන ලද වේළුවන නම් ආරාමයේ බුදුරජාණන් වහන්සේ වැඩ සිටින සමයේ පිඬු පිණිස හැසිරෙන අනඳ මාහිමියන් දුටු දේවදත්ත තෙරණුවෝ උන් වහන්සේට මෙසේ පැවසූහ.

“ඇවැත්නි, මම අද පටන් බුදුරදුන් ද මහා සංඝයා ද හැර මට පක්ෂපාති සංඝයා සමග පොහොය කරමි, අනෙක් විනය කර්ම ද කරමි.”

පිණ්ඩපාතයෙන් පසුව වෙහෙරට වැඩි ආනන්ද තෙරණුවෝ දෙව්දත් තෙරුන් විසින් ප්‍රකාශ කරන ලද සියල්ල බුදුරදුන්ට දන්වා සිටියහ.

එම අවස්ථාවේ බුදුරජාණන් වහන්සේ මෙසේ වදාළ සේක.

**සුකරානි අසාධූනි**
**අත්තනෝ අහිතානි ච**
**යං වේ හිතං ච සාධුංච**
**තං වේ පරම දුක්කරං**

**(ධම්ම පදය - අත්ත වග්ගය)**

අයහපත් දෑ මෙන් ම තමාට අහිත පිණිස හේතුවන දෑ ද පහසුවෙන් කළ හැකි ය. යහපත් දෑ මෙන් ම තමාට හිතකර වූ දේ කිරීම ඉතා ම දුෂ්කර ය.

## සුද්ධි අසුද්ධි පච්චත්තං

සැවැත් නුවර චුල්ලකාළ නම් උපාසක කෙනෙක් ධාර්මික ව ජීවත් වෙයි. ඔහු රාත්‍රියෙහි වෙහෙරට ගොස් බණ අසා අලුයම් වේලාවෙහි ගෙදර බලා යයි. අභාග්‍යයකට මෙන් එදින රාත්‍රියෙහි සොරුන් ගෙයක් බිඳ ධනය පැහැර ගන්නා කල්හි ගෙහිමියෝ අවදි වූහ. සොරු පැහැරගත් ධනය රැගෙන පලා ගියහ. ගෙහිමියෝ සොරුන් පසු පස ලුහුබඳින්නට වූහ. කර කියා ගත හැකි කිසිවක් නැති එක් සොරෙක් බණ අසා ගෙදර යන චුල්ලකාළ උපාසක අසලට සොරබඩු දමා සැඟවී පලා ගියේ ය.



ගෙහිමියෝ චුල්ලකාළ උපාසකත් තම නිවසේ භාණ්ඩත් දැක මෙතෙම සොරා යැයි සිතා පහර දෙන්නට වූහ. උදැසන ජලය ගෙනයාමට පොකුණට පැමිණි දාස ස්ත්‍රීහු මොහු හොඳ උපාසකයකු බවත් කිසිවකුට වරදක් නොකරන අයකු බවත් විවිධාකාරයෙන් කරුණු කියා ඔහු ගලවා ගත්හ.

චුල්ලකාළ උපාසක තුමා විහාරයට ගොස් තමාට සිදුවූ හදිසි කරදරය භික්ෂූන් වහන්සේලාට හෙළි කළේ ය. භික්ෂූන් වහන්සේ වෙතින් තොරතුරු දැනගත් බුදුරජාණන් වහන්සේ පහත සඳහන් ගාථාව වදාළහ.

**අත්තනාව කතං පාපං**
**අත්තනා සංකිලිස්සති**
**අත්තනා අකතං පාපං**
**අත්තනාව විසුජ්ඣති**
**සුද්ධි අසුද්ධි පච්චත්තං**
**නාඤ්ඤෝ අඤ්ඤං විසෝධයේ**

**(ධම්ම පදය - අත්ත වග්ගය)**

තමා විසින් ම කරන ලද පාපය තමා කිලිටි කරන්නේ ය. තමා විසින් නොකරන ලද පාපය තමා පිරිසිදු කරයි. පිරිසිදු බව හෝ අපිරිසිදු බව තම තමා අත ම පවතින්නකි. කෙනෙක් තව කෙනකු පිරිසිදු නොකරයි.

මෙම දේශනා අනුව බැලීමේ දී පැහැදිලි වන්නේ අපගේ ජීවිත නිවැරැදි මග ම ගමන් කරවීමට ඒවා විශාල පිටුබලයක් සපයන බවයි.

පළමු ගාථාවේ එන සාධු යන්නෙන් අදහස් වන්නේ යහපත් චර්යාවන් ය. අසාධු යනු අයහපත් චර්යාවන් ය. ඒ ඒ සංස්කෘතික, ආගමික, සාමාජික පරිසරය අනුව හොඳ නරක පිළිබඳ අර්ථ නිරූපණ විවිධ ස්වරූප ගත හැකි ය. මෙහි දී අර්ථවත් වන්නේ බෞද්ධ ඉගැන්වීම් අනුව යහපත් දේ යන්න ය. බුදු දහම තුළ පෞද්ගලික සුබ සිද්ධිය උදෙසා අදාළ කරගත හැකි ප්‍රායෝගික ඉගැන්වීම් සමුදායක් පවතී.

**පස්පවින් වැළකීම**
**දස අකුසලයෙන් වෙන්වීම**
**පරාභව කරුණුවලින් බැහැර වීම**

වැනි ප්‍රකට කරුණු කිහිපයක් පිළිබඳව වුව ද සලකා බැලීමෙන් ඒ බව තහවුරු වේ. අසාධු ධර්මයන්ගෙන් වෙන්වීම පහසු නොවේ. එම නිසා පළමු ගාථාවෙන් අයහපත් දෑ සිදු කිරීම පහසු බව දේශනා කොට තිබේ. "**කරන කලට පව් මිහිරිය මී සේ**" යැයි වීදාගම මා හිමියන් ලෝවැඩ සඟරාවේ දී ප්‍රකාශ කළ පරිදි පව්කම් කිරීම මී පැණි මෙන් රසවත් ය; පහසු ය; විනෝදය සතුට ගෙන දෙයි. එහෙත් එය තාවකාලික ය. එහි ප්‍රතිඵල අපගේ මෙලොව යහපත වළකාලන අතර භවගාමී දිවිපැවැත්ම ද කටුක එකක් බවට පත්කිරීමට හේතු වේ.

දෙව්දත් තෙරණුවන් උපතින් රාජකීයයෙකි. එහෙත් උන් වහන්සේ තමාගේ හැකියාවන් තමාගේ අයහපත පිණිස ම භාවිත කළ බැවින් තමා උපදවාගත් අභිඥාවලින් ද පිරිහී ගියහ; අපායගාමී වූහ. අපාය යනු පිරිහීම, **සැප නැති තැන** යන අර්ථ දෙන පදයකි. අප ද පහසු වුවත් සුන්දර වුවත් අයහපත් දෑ සිදු කළහොත් අපගේ දිවිය ම සැප අහිමි, දුෂ්කර, කටුක තත්ත්වයකට පත් වීම නිරනුමාන ය. එබැවින් සිසුන් වන අපට ද මතුවන ගැටලු හා දුෂ්කරතා විඳ දරා ගනිමින් ඇප-කැප වී අධ්‍යාපන කටයුතුවල නිරත වුව හොත් උසස් දිවි පැවැත්මක් නිර්මාණය කර ගත හැකි ය. නූතන සමාජයේ ඉහළින් ම වැජඹෙන බොහෝ දෙනා එසේ ඇප-කැප වීම තුළින් තම ජීවිතය උසස් තත්ත්වයකට පත්කර ගත් බවට බොහෝ තොරතුරු සපයා ගත හැකි ය.

දෙව්දත් තෙරණුවන් අයහපත් දෑ සිදු කිරීමෙන් තමා පමණක් පිරිහීමට පත්වූවා නොවේ. හෙතෙම තම මිත්‍රයා වූ ශ්‍රද්ධාවන්ත අජාසත්ත මහ රජතුමා ද පිතෘඝාතක ආනන්තරිය පාපකර්මයට යොමු කළේ ය. එපමණක් නොව දේවදත්ත තෙරණුවන් අනුගමනය කළ භික්ෂූහු ද අයහපතට යොමු කරන ලදහ. අසත්පුරුෂයා තමා පමණක් පිරිහෙන්නේ නොවේ. ඔහු ආශ්‍රිත සමාජය ද පරිහානියට යොමුකරන්නෙකි. මේ තත්ත්වය මනාව වටහා ගෙන අප අසාධු චර්යා දුරු කළ යුතු අතර එවැනි අපචාරී චර්යා සහිත අය ඇසුරු නොකිරීමට ද උත්සාහ කළ යුතු ය; පුරුදු විය යුතු ය. කිරි කළයට ගොම බිඳුවක් වැටීමෙන් එය සම්පූර්ණයෙන් ම නිශ්ප්‍රයෝජන වේ. එම නිසා අපගේ සාධුසම්මත ජීවිත නමැති කිරි කළයට අසාධු චර්යා නමැති ගොම බිඳුවක් එකතු වීමට ඉඩ නොතබා කටයුතු කරමු. එය එතරම් පහසු කාර්යයක් නොවනු ඇත. නමුත් පියවරෙන් පියවර අපි ඒ සඳහා පුහුණු වෙමු; සාධුචර්යාවන්ට ම යොමුවෙමු. එයින් ජීවිතයට ලැබෙන ආලෝකය විශාල ය.

අප කෙතරම් නිවැරැදි වුවත් නොකළ වරදකට වැරැදිකාරයකු වී ඇණුම්-බැණුම්, දඬුවම් විඳීමට සිදු වන අවස්ථා ඇත. නිවැරැදි අපට යමකු දඬුවම් කළත් අප වැරැදිකාරයන් වන්නේ නැත. මක්නිසා ද යත් අප වරදක් සිදුකොට නොමැති බැවිනි. අල්ලෙහි තුවාලයක් නැතිනම් මොන තරම් විෂක් අතින් ගනු ලැබුවත් ශරීරයට විෂ ඇතුළු නොවෙන බව බුද්ධ දේශනාවයි.

අපි කිසියම් වරදක් කළෙමු නම් එයින් කිලිටි වූ චරිත ඇත්තෝ වෙමු. උපක්‍රමයකින් හෝ නීතියේ රැහැනින් මිදී සිටියත් තම හෘද සාක්ෂ්‍යය අනුව තමා වැරැදිකාරයෙක් ම වන්නේ ය. ඊට උරුම වන දුක් විපාකයෙන් අත මිදීම පහසු නොවේ. අප මෙලොව වශයෙන් කායික මානසික පීඩාවලට යොමු වන්නේ ය. පරලෝක වශයෙන් අපායාදී දුක්වලට භාජනය වන්නේ ය. අප විසින් කළ යුතු වන්නේ පව්කම්වල විපාක දැන හඳුනාගෙන ඒවායින් ඈත් ව සිටීමයි. රෝගයක් ඇති වූවාට පසු එයට පිළියම් කරනවාට වඩා රෝගයෙන් වැළකී සිටීම වඩාත් සුදුසු ය යන්න බෞද්ධ උපදේශයයි.

තමා විසින් කරන ලද අයහපත් ක්‍රියා නිසා තමා අපිරිසිදු වනවා මෙන් ම තමා විසින් කරන ලද යහපත් ක්‍රියා නිසා තමා පිරිසිදු වීම ද සිදු වේ. කෙනකු පිරිසිදු වන්නේ හෝ අපිරිසිදු වන්නේ ඔහුගේ ක්‍රියා කලාපය අනුව ය.

මගධාධිපති අජාසත් රජුගේ පූර්ණ අනුග්‍රහය ලැබුණේ වී නමුත් දෙව්දත් තෙරණුවන්ට කළකම්වලින් ගැළවීමට නොහැකි විය. එසේ ම නොකළ වරදකට තාඩන-පීඩන ලද චුල්ලකාළ උපාසකතුමා ආධ්‍යාත්මික වශයෙන් ජීවිතය උසස් ම තත්ත්වයකට පත් කර ගත්තේ ය. එම නිසා අපි ද කළ වැරැදි විවිධ අයථා ක්‍රම මගින් වසා නොගෙන නොකළ වැරැදිවලට හසු නොවී කල්පනාකාරී ව කටයුතු කරමු.

## සාරාංශය

තමාගේ අයහපත පිණිස හේතුවන දෑ පහසුවෙන් කළ හැකි අතර තමාට හිතකර වූ යහපත් දේ කිරීම ඉතා ම දුෂ්කර ය.

තමා විසින් කරන ලද පාපය තමා කිලිටි කරන්නේ ය. තමා විසින් නොකරන ලද පාපය තමා පිරිසිදු කරයි. පිරිසිදු බව හෝ අපිරිසිදු බව හෝ තම තමා අත ම පවතින්නකි. කෙනෙක් තව කෙනකු පිරිසිදු නොකරයි.

## ක්‍රියාකාරකම

1. මෙම ගාථා නිවැරැදි උච්චාරණයෙන් යුතු ව තාලයකට ගායනා කරන්න.

2. මෙම ගාථා ආශ්‍රයෙන් අපට ලබාගත හැකි උපදෙස් ඇතුළත් තීරු ලිපියක් රචනා කරන්න.

## පැවරුම

- මෙම පාඩමේ ඇතුළත් ධම්ම පද ගාථාවල අර්ථ ඇතුළත් වන සේ පද්‍ය නිර්මාණය කරන්න.